# සුභාෂිතයෙන්

කෙතෙක් වෙහෙස ලදුවත් සුදනෝ　　පවර
උදක් ලෝ සතුන් සිත දුක් කෙරෙහි　　දුර
පසක් රාහු මුවපත් වුව ද　　බියකර
අනෙක් පසින් ලොව හෙලි කෙරෙයැ　　හිමකර

**ගැදි ගීයකින් (නොපැදි පැදියෙන්)**

පවර සුදනෝ
කෙතෙක් වෙහෙස ලදුවත්
උදක්
ලෝ සතුන් සිතැ දුක්
දුරු කෙරෙති
එය හරියට
එක් පසක්
බියකර රාහුගේ මුවට
අසු උවත් හිමකර අනෙක් පසින්
ලොව හෙලි කරනු වැනි වේ.

**තේරුම ....**

උතුම් සුදනෝ තමන්ට කොතරම් අපහසුවක් සිදු වුවත් එය නොතකා ලෝක සත්වයින්ගේ (අනෙක් මිනිසුන්ගේ) සිත් තුල ඇති දුක් ගිනි නිවා ලති. එය හරියට එක් පැත්තකින් බයංකර වූ රාහුගේ කටට අසු වී සිටියදීත් සඳ රාහුගේ කටට අසු නොවී ඇති පැත්තෙන් ලෝකයට එලිය දෙනවා වැනිය.

**පැහැදුම....**

රාහු යනු ඉර බව සමහරු කියති. ''සඳ රිවි තමන් රහු මුව පත් වූ සඳෙහි'' යන පැදි පිය අනුව නම් රිවිත් රාහුත් දෙදෙනෙකි. අද සවැනි පන්තියේ උගන්නා ලමයකු උවත් සඳ රාහු අල්ලන හැටි දනිතැයි සිතමි. ඒ අනුව රාහුගේ මහ දසාව යනු කුමක් දැයි මම නොදනිමි. එය තේරුම් ගැනීමට තරම් පැහුනු දැනුමක් මට නැත. සමහර පොත්වල රාහු අසුරයකු ලෙස ද හඳුන්වා ඇති බව මතකය. රාහු ගිලි හඳ ආපසු එලි බසින්නේ රාහුගේ ඉදිරිපස මුවින්ද, පසුපස මුවින්ද යනුත් කියන්නට තරම් දැනුමක් මට නැත. සැඩකර යනුවෙන් ඉර හඳුන්වන්නේ ඉරු රැස් සැර නිසාය. හිමකර යනුවෙන් සඳ හඳුන්වන්නේ එහි රැස් හිම මෙන් සිසිල් නිසා ය.

විකසිත

# සිත

කන්දෙන් ඉපදී
සීත දිය රැළි
හෝ හෝ හඬ දෙනවා
වනමල් අරනේ අතු අග රැඳිලා
විහඟුන් සුළඟේ නැළවෙනවා
ලස්සනම ලොවේ රුව
සැලෙන විටදි නොවෙද්දෝ....

අසිරි ලොවේ සිරියා
දසුනෙනි නරඹන්නේ
හොවාගෙන හැඟුම් මුවාවෙලා
හැංගි හැංගි හිඳිමින්
ලොවට මවාලන්නා...

අමා ගඟුලෙ ගිලෙමින්
ලොවෙන් නිවීයන්නා
කිමද එලෙස අසිරිය පානා
සුරැකිය යුතුම මනා
සියුමැලි සිතම විනා...

**පූජ්‍ය විලගම ආනන්දසිරි හිමි**
ක්වීන්ස්ලන්ත බෞද්ධ විහාරය

සාහිත්‍යයේ වෙබ් කවුලුව
www.ketapathpawra.com

ලෝක ව්‍යාප්ත ජාලයේ පෙරළිකාරයා

# Google

ගූගල් සර්ච් එන්ජිම (www.google.com) දැන් අන්තර් ජාලයේ (internet) ලෝක ව්‍යාප්ත ජාලයේ (world wide web) ප්‍රධාන ම සෙවුම් එන්ජිම (Search Engine) බවට පත්ව ඇත. දැන් දැන් අනෙක් තරගකාරී සෙවුම් වෙඩ් අඩවි ගූගල් අනුකරණය කරන්නට පෙළඹීමෙන් ම ගූගල් ලබා ඇති මේ ප්‍රමුඛතාව මනාව පැහැදිළි වෙයි.

ගූගල් ආරම්භ වන්නේ 1998 දී ය. අනෙක් තරගකාරී සෙවුම් යන්ත්‍ර හා සළකා බනව විට ගූගල් තවම අඩු වයසේ දරුවෙකි. ස්ටුන්ෆෝඩ් විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් දෙදෙනකු වන ලැරී පේජ් හා සර්ජි බ්‍රින් ගූගල් සෙවුම් එන්ජිමේ නිර්මාතෘවරුන් දෙදෙනා ය.

පේජ් හා බ්‍රින් දෙදෙනාම 1996 සිට ම 'බැක් රබ්' යනුවෙන් ඔවුන් නම් කර තිබූ සෙවුම් එන්ජිමක් සෑදීම සඳහා පර්යේෂණ කරමින් සිටිය හ. යහූ සම නිර්මාතෘ ඩේවිඩ් ෆිලෝ ගේ උනන්දු කිරීම මත ඔවුහු 1998 දී සිය ව්‍යාපාරය ලියාපදිංචි කළ අතර සිය පර්යේෂණ සඳහා අනුග්‍රාහකයන් සොයන්නට ද වෙහෙසුණ හ. ඔවුන් විසින් ගූගල් ආයතනය ආර්භ කරනු ලැබුවේ 1998 වසරේ සැප්තැම්බර් 7 වන දා ය. හිතවතකුගේ ගරාජයක ඔවුහු සිය ව්‍යාපාරිකය ආරම්බ කළ හ.

ගූගල් සෙවුම් එන්ජිමේ පහසු බව නිසාත් කාර්යක්ෂම බව නිසාත් ඉතා ඉක්මනින් ම ලෝක ව්‍යාප්ත ජාලය තුළ සිය ස්ථානය තහවුරු කරගන්නට ඔවුනට හැකි විය. ලෝක ව්‍යාප්ත ජාලයේ වඩාත් සාර්ථක හා නිවැරදි සෙවුම් එන්ජිම ලෙසට ගූගල් නිසි ගෞරවය දිනා ගත්තේ ය.

ඉග්‍රීසි භාෂාවේ පමණක් රැඳී නොසිට වෙනත් භාෂාවනගෙන් ද සිය සේවාවන් පවත්වාගෙන යන්නට ගූගල් ආයතනය ගත් පියවර නිසා ඔවුනගේ ව්‍යාප්තිය ඉතා වේගවත් එකක් බවට පත් විය. අද වන විට මහා බ්‍රිතාන්‍යය තුළ මේ ක්ෂෙත්‍රයේ ඔවුනගේ කොටස 70% ක් බවට පත් වීමෙන්ම ගූගල් හි සාර්ථකත්වය මැන ගත හැකි ය.

ගූගල් සෙවුම් එන්ජිමේ පමණක්ම රැඳී නොසිට වෙනත් අංශ කරාධ ගූගල් සිය සේවාවන් දීර්ඝ කරන්නට උත්සාහ ගත් හ. ඒ අනුව ජීමේල් (www.gmail.com) නමින් සිය ඊමේල් සේවාත් ගූගල් අර්ත් (google earth) නමින් සිතියම් සේවාවත් ඔවුහු ආරම්භ කළ හ. ඉතා විශාල මතක ධාරිතාවක් සිය ඊමේල් සේවා ලබාගන්නන්ට ලබා දෙන්නට ගූගල්ට හැකි වීම නිසාම අද වන විට ජීමේල් සේවාව ලෝකයේ ජනප්‍රියම ඊමේල් සේවාවක් පවට පත් වෙමින් තිබෙයි. ඒසේම ගූගල් අර්ත් මෘදුකාංගය අන්තර්ජාලය ඔස්සේ බාගත කිරගැනීමෙන් ලෝකයේ ඕනෑම තැනක පිහිටීම චන්ද්‍රිකා සිතියම් මගින් බලාගන්නට ඔබට හැකි වෙයි.

ගූගල් අද සමාජය තුළට කොයි තරම් දුරට රිංගා ඇතිද කිවහොත් ගූගල් යන වචනය ක්‍රියාපදයක් ලෙස අද ඉංග්‍රීසි ශබ්දකෝෂ වලට පවා ඇතුල් වී ඇත. ගූගල් සෙවුම් එන්ජිම මගින් ලෝක ව්‍යාප්ත ජාලයේ තොරතුරු සෙවීමට අද කියන්නේ ''ගූගල් කරනවා'' කියා ය.

ගූගල් මේ යමින් සිටින අති ධාවනකාරී ගමන කොතැනින් නවතියිද යන්න ලෝක ව්‍යාප්ත ජාලය දෙස බලා සිටින සැමගේම සිතේ අද ඇතිවී ඇති ප්‍රශ්ණයයි.

ජගත්

# අපේ හපන්නු

## ඔස්ට්‍රේලියා විවෘත ජාතික ටයිකොන්ඩෝ ස්පාරින් (සටන්) තරගාවලිය 2007

## Australian Open & National Teakwondo Championship (Sparing) 2007



2007 සැප්තැම්බර් 22 වන දින ඇඩිලේඩ්හි සුපර් ඩෝර්ම් හි පැවති ඔස්ට්‍රේලියානු විවෘත ජාතික ටයිකොන්ඩෝ ස්පාරින් (සටන්) තරගාවලියේදී සචින් පත්මපෙරුම (වයස 8 - 9 නිල්පටි බර 19 - 22 කිග්‍රෑ) රන්පදක්මක් දිනා ගත්තේ ය. සචින් මෙම තරගාවිලි යසඳහා වික්ටෝරියානු ප්‍රාන්තය නියෝජනය කළ එකම ශ්‍රී ලාංකික දරුවායි.

## ඔස්ට්‍රේලියා විවෘත හා ජාතික ටයිකොන්ඩෝ ස්පාරින් (පුම්සේ) තරගාවලිය 2007

## Australian Open & National Teakwondo Championship (Poomse) 2007



2007 සැප්තැම්බර් 22 වන දින ඇඩිලේඩ්හි සුපර් ඩෝර්ම් හි පැවති ඔස්ට්‍රේලියානු විවෘත ජාතික ටයිකොන්ඩෝ ස්පාරින් (පුම්සෙ) තරගාවලියේදී ඇන්ජලා ගුණවර්ධන (වමේ) (වයස 13 - 14 කහ පටි රන් පදක්කමක් ද සචින් පත්මපෙරුම (මැද) (වයස 8 - 9 නිල්පටි) රන් පදක්මක් ද හසිඳු සරංගුහේවාගේ (දකුණ) (වයස 14 - 17 කහ පටි) රිදී පද්කමක් ද දිනා ගත් හ
වික්ටෝරියා ප්‍රාන්ත තරගාවලියේදී ද පිළිවෙලින් තඹ රිදී හා රන් පදක්කම් දිනාගත් මේ දරුවෝ ඉහත තරගාවලියේ වික්ටෝරියා ප්‍රාන්තය නියෝජනය කළ ශ්‍රී ලාංකික දරුවෝ වෙති

www.thisara.com

